# ශ්‍රී ලාංකේය භික්ෂු චීවරයේ භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

මණ්ඩකන්දේ සමිත හිමි - බෞද්ධ අධ්‍යයනාංශය

ක්‍රි.පූ. තුන්වන සියවසේ සිදුවූ මහින්දාගමනයත් සමඟ ලක්දිව ද භික්ෂු පරම්පරාවක් ස්ථාපිත විය. එලෙස ස්ථාපිත වූ භික්ෂු පරම්පරාව පශ්චාත් කාලීනව සිදුවූ විවිධ බලපෑම් හමුවේ, විවිධ හැඩයන්ගෙන් යුක්ත විය. ඒ අනුව මහාවිහාරය, ජේතවනය, අභයගිරිය, ග්‍රාමවාසී, අරණ්‍යවාසී, පාංශුකූලික මෙන්ම  සියම්, අමරපුර සහ රාමඤ්ඤ ආදී සම්ප්‍රදායන්හි භික්ෂූන් වහන්සේලාගේ චීවර භාවිත ස්වභාවයන්ගේ විවිධත්වයක් දැකගත හැකි විය. යථෝක්ත කරුණු අනුසාරයෙන් මහින්දාගමනයේ සිට නූතනය දක්වා ශ්‍රී ලාංකේය භික්ෂු චීවරයේ භාවිතය පිළිබඳ අධ්‍යයනය කරමින් අදාළ පර්යේෂණය සිදුකිරීමට අපේක්ෂා කෙරේ. මෙහි දී 'මහින්දාගමනයේ ආභාසයත් සමඟ ධර්මානුකූලවූත්, විනයානුකූලවූත් චීවර භාවිතයක් හඳුන්වා දුන්න ද, එය පශ්චාත් කාලීනව වෙනස් වන්නේ ඇයි?' යන පර්යේෂණ ගැටලුව චීවර පරම්පරාවේ විකාශය ඇසුරින් අධ්‍යයනය කෙරේ. මෙම පර්යේෂණ ගැටලුව අධ්‍යයනයේ දී චීවර පාරුපනයේ සම-විෂමතා මොනවාද?, ඒ සඳහා බලපෑ හේතු සාධක කවරේද?, යන පර්යේෂණ ප්‍රශ්න පිළිබඳව ද අවධානය යොමු කෙරේ. ගුණාත්මක දත්ත පදනම් කරගත් මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පිටකත්‍රය, අට්ඨකථා සහ ටීකාද, ද්විතීය මූලාශ්‍රය වශයෙන් මේ සම්බන්ධ පළ වී ඇති සිංහල හා ඉංග්‍රීසි කෘතිද, අන්තර්ජාල ලිපිද අධ්‍යයනය කෙරේ. මෙම අධ්‍යයනයට අනුව ලාංකික භික්ෂූන් වහන්සේලා ප්‍රායෝගික සහ සමාජවිද්‍යාත්මක කරුණු පදනම් කොට ගනිමින් ඒ ඒ සම්ප්‍රදායන්ට අනුකූලව චීවර පරිහරණය කිරීමක් දැකගත හැකි විය. එනමුත් චීවර පරිහරණය හා සම්බන්ධ ධර්මානුකූල හෝ විනයානුකූල වෙනස්වීමක් දැකගත නොහැකි බව මෙම අධ්‍යයනයෙන් තවදුරටත් අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *චීවර, ධර්මානුකූල, විනයානුකූල, ශ්‍රී ලංකාව, සම්ප්‍රදාය*